ගණිත ඔලිම්පියාඩ් තරගාවලිය

පළාත් මට්ටමේ පුහුණු සංචිතයට තෝරා ගැනීමේ පරීක්ෂණය - 2013

I කාණ්ඩය

විභාග අංකය : .....


පන්තිය : .....

පාසල : .....

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

කාලය : පැය 1

01.



රූප සටහනෙහි එකිනෙකට යාබදව ආසන්නයේ පිහිටි ඕනෑ ම කව 2ක් තුළ ඇති සංඛ්‍යාවල එකතුව පූර්ණ වර්ගයක් වන පරිදි පිළිවෙලින් a හා b සඳහා යෙදිය හැකි සංඛ්‍යා දෙක මොනවා ද ?

(1) 23,16 (2) 14, 23 (3) 23, 55 (4) 55, 23

02. එක්තරා සංඛ්‍යාවක් 60න් බෙදූවිට ශේෂය 49ක් වේ. එම සංඛ්‍යාව 15න් බෙදූවිට ශේෂය කුමක් ද?

(1) 3 (2) 4 (3) 5 (4) 9


03. $12345 \times 9 + 6 = A$ නම්, A හි අගය කුමක් ද?

(1) 11 111 (2) 111 111 (3) 1 111 111 (4) 11 111 111

04. අනුගාමී නිඛිල සංඛ්‍යා 7ක එකතුව 77ක් වේ. එම සංඛ්‍යා අතරින් විශාලම සංඛ්‍යාව කුමක් ද ?

(1) 8 (2) 11 (3) 14 (4) 17

05.



මෙම රූපයේ අඳුරු කර ඇති පෙදෙස මගින් දැක්වෙන භාග සංඛ්‍යාව කුමක් ද?

(1) $\frac{5}{12}$ (2) $\frac{7}{12}$ (3) $\frac{5}{7}$ (4) $\frac{5}{6}$


06. ධන නිඛිල සංඛ්‍යා යුගලයක ගුණිතය 120 වේ. එම සංඛ්‍යා යුගලයේ එකතුව සඳහා ලැබිය හැකි විශාලම අගය කුමක් ද?

(1) 34 (2) 43 (3) 62 (4) 121

07. වට්ටක්කා ගෙඩි 3ක් වරකට 2 බැගින් කිරා බැලුවිට ලද පාඨාංක වන්නේ 9 kg, 11kg, හා 12kg වේ. වැඩිම ස්කන්ධයක් ඇති වට්ටක්කා ගෙඩියේ ස්කන්ධය විය හැකි අගය කුමක් ද?

(1) 5 kg (2) 6 kg (3) 7 kg (4) 8 kg

08.




පොළවෙහි වෘත්තයක් ඇඳ එය මත A සිට L දක්වා නම්කර ඇති ස්ථානවල බෝලය බැගින් තබා ඇත. දක්ෂිණාවර්ත අතට A වලින් ආරම්භකර 1 සිට 3 දක්වා ගණන් කරමින් තුන්වැනි බෝලය ඉවත් කරනු ලැබේ. මෙම ක්‍රියාව බෝල 2ක් ඉතිරිවන අවස්ථාව තෙක් කරගෙන යනු ලැබේ. අවසානයට ඉතිරිවන බෝල දෙක පිහිටන ස්ථාන වන්නේ මොනවා ද ?

(1) A, E (2) B, G (3) B, H (4) E, J

09. දෙදියවල ගමෙහි සෑම බ්‍රහස්පතින්දා දිනකම සති පොළ පැවැත්වේ. එක්තරා වර්ෂයක ජනවාරි 1වැනි දින සහ පෙබරවාරි 14වැනි දින අතරතුර සතිපොළ පැවැත්විය හැකි වැඩිම වාර ගණන කීය ද?

(1) 5 (2) 6 (3) 7 (4) 8

10.



a + g + d = 10

b + g + e = 10

c + g + f = 10

ඉංග්‍රීසි අක්ෂර මගින් එකිනෙකට වෙනස් ධන පූර්ණ සංඛ්‍යා 7ක් නියෝජනය කෙරේ නම් ඉහත සබඳතාවලට ගැළපෙන පරිදි g මගින් නියෝජනය කෙරෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 4 (2) 3 (3) 2 (4) 1

11. 99 සිට 199 දක්වා සියලු පූර්ණ සංඛ්‍යා ලිවීමේ දී 0 ඉලක්කම ලියවෙන වාර ගණන කීය ද?

(1) 19 (2) 20 (3) 21 (4) 22

12. $20^{50} \times 50^{20}$ හි ඉලක්කමෙන් අගට ඇති බිංදු ගණන කීය ද?


06. ධන නිඛිල සංඛ්‍යා යුගලයක ගුණිතය 120 වේ. එම සංඛ්‍යා යුගලයේ එකතුව සඳහා ලැබිය හැකි විශාලම අගය කුමක් ද?

(1) 34 (2) 43 (3) 62 (4) 121

07. වට්ටක්කා ගෙඩි 3ක් වරකට 2 බැගින් කිරා බැලුවිට ලද පාඨාංක වන්නේ 9 kg, 11kg, හා 12kg වේ. වැඩිම ස්කන්ධයක් ඇති වට්ටක්කා ගෙඩියේ ස්කන්ධය විය හැකි අගය කුමක් ද?

(1) 5 kg (2) 6 kg (3) 7 kg (4) 8 kg

08.




පොළවෙහි වෘත්තයක් ඇඳ එය මත A සිට L දක්වා නම්කර ඇති ස්ථානවල බෝලය බැගින් තබා ඇත. දක්ෂිණාවර්ත අතට A වලින් ආරම්භකර 1 සිට 3 දක්වා ගණන් කරමින් තුන්වැනි බෝලය ඉවත් කරනු ලැබේ. මෙම ක්‍රියාව බෝල 2ක් ඉතිරිවන අවස්ථාව තෙක් කරගෙන යනු ලැබේ. අවසානයට ඉතිරිවන බෝල දෙක පිහිටන ස්ථාන වන්නේ මොනවා ද ?

(1) A, E (2) B, G (3) B, H (4) E, J

09. දෙදියවල ගමෙහි සෑම බ්‍රහස්පතින්දා දිනකම සති පොළ පැවැත්වේ. එක්තරා වර්ෂයක ජනවාරි 1වැනි දින සහ පෙබරවාරි 14වැනි දින අතරතුර සතිපොළ පැවැත්විය හැකි වැඩිම වාර ගණන කීය ද?

(1) 5 (2) 6 (3) 7 (4) 8

10.



$a + g + d = 10$

$b + g + e = 10$

$c + g + f = 10$

ඉංග්‍රීසි අක්ෂර මගින් එකිනෙකට වෙනස් ධන පූර්ණ සංඛ්‍යා 7ක් නියෝජනය කෙරේ නම් ඉහත සබඳතාවලට ගැළපෙන පරිදි g මගින් නියෝජනය කෙරෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 4 (2) 3 (3) 2 (4) 1

11. 99 සිට 199 දක්වා සියලු පූර්ණ සංඛ්‍යා ලිවීමේ දී 0 ඉලක්කම ලියවෙන වාර ගණන කීය ද?

(1) 19 (2) 20 (3) 21 (4) 22

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

12. $20^{50} \times 50^{20}$ හි ඉලක්කම්වල එකතුව ඇති විය හැකි අගය කීය ද?


13. පිළිතුර (-6) ලෙස ලැබීමට (-8)න් අඩු කළ යුතු සංඛ්‍යාව කීය ද?

(1) (-2) (2) (+2) (3) (-6) (4) (+6)

14. n යනු ධන නිඛිලයක් විට $A = n^2+n+1$ වන පරිදි A මගින් ප්‍රථමක සංඛ්‍යාවක් දැක්වේ. n සඳහා වඩාම සුදුසු අගය කාණ්ඩය කුමක් ද?

(1) 0,1 පමණි (2) 0,1,2 පමණි (3) 0,1,2,3 පමණි (4) ඕනෑම ධන නිඛිලයක්

15.



එක් සංඛ්‍යාවක් එක් වරක් පමණක් යොදා ගනිමින් රූපයෙහි කොටු තුළ 1 සිට 25 දක්වා ලියා නිර්මාණය කරන මැජික් කොටුවේ ඕනෑම පේළියක, තීරයක හෝ විකර්ණයක් ඔස්සේ එකතුව සමාන වේ. එම එකතුව වශයෙන් ලැබෙන අගය කීය ද?

(1) 45 (2) 55 (3) 65 (4) 75

16. ඡන්ද විමසීමක් සඳහා අපේක්ෂකයින් 4ක් ඉදිරිපත් විය. ප්‍රකාශ කළ වලංගු ඡන්ද සංඛ්‍යාව 61කි. ජයග්‍රාහකයාට ලැබිය හැකි අඩුම ඡන්ද ගණන කීය ද?

(1) 15 (2) 16 (3) 17 (4) 20

17. ඉලක්කම් 5කින් යුත් සංඛ්‍යාවක ඉලක්කම්වල එකතුව 2 වේ. එකිනෙකට වෙනස් මෙවැනි සංඛ්‍යා කීයක් තිබේ ද?

(1) 2 (2) 3 (3) 4 (4) 5

18. a යනු සමවතුරස්‍ර සංඛ්‍යාවකි. එම සංඛ්‍යාව දෙපස වූ නිඛිල සංඛ්‍යා ප්‍රථමක සංඛ්‍යා වේ. මේ අනුව පහත දැක්වෙන ප්‍රකාශනවලින් වඩාත් ම නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) $0 < a < 4$ (2) $0 < a < 10$ (3) $9 < a < 25$ (4) $25 < a < 100$

19.

ස	හ	න		
	ද	ස	ත	
ද	ල	න	ද	

මෙම එකතු කිරීමේ ගැටළුවේ 'ස' හි අගය කුමක් ද?

(1) 7 (2) 8 (3) 9 (4) 8 හෝ 9

20. සෑම සංඛ්‍යා යුගලයක ම එකතුව සමානවන පරිදි 9, 15, 33, 22, 49, 40, 13, 47, 53 සහ 29 යන සංඛ්‍යා දහය යුගල් 5කට වෙන්කරනු ලැබේ. 29 ඇතුළත් සංඛ්‍යා යුගලයේ අනෙක් සංඛ්‍යාව කුමක් ද?

(1) 33 (2) 40 (3) 47 (4) 49

PAST PAPERS WIKI

(4) WWW.PastPapers.WiKi (4)

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න